පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - **492**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල**
**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

**மாவட்ட செயலகம் - பதுளை**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No – 492

District Secretariat – Badulla

Submission of the observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4)

ආකෘති 01

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

| රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා | ගණන්දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය |
|---|---|
| වියදම් උපයෝගිතා ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | වියදම් උපයෝගිතා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර , මේ වන විට මෙය යාවත්කාලීන කර ඇත. |
| 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි. | මෙම රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය ගණකාධිකාරී පමණක් භාවිතා කරනු ලැබේ. |
| 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි. | මෙම රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත.<br>තවද, මුරපද වෙනස් කිරීමට අදාළව පවත්වාගෙන යන ලේඛනය ගණකාධිකාරී භාරයේ ඇත. |
| වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන ලෙස විෂය භාර නිලධාරී වෙත උපදෙස් ලබාදී ඇති අතර, 2026 වර්ෂයේ APP/MPP/APPP හා වාර්ෂික ප්‍රසම්පාදන කාල රාමුව සකස් කර අදාළ අමාත්‍යාංශයේ අනුමැතියට යොමුකර ඇත. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | කාර්තුවකට වරක් පවත්වන සෑම විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදීම මේ සම්බන්ධයෙන් දැනුවත් කරන අතර, ප්‍රගති සමාලෝචනය ද සිදු කරයි. ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. මේ වන විට මසක් ඇතුළත පිළිතුරු සැපයීම සිදු වේ. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, විගණන විමසුම් වලට පිළිතුරු නියමිත දිනට නිවැරදිව ලබාදෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. වර්තමානය වන විට මසක් තුළ පිළිතුරු සැපයීම සිදු වේ. |

| | |
|---|---|
| මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි. | මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කරනු ලැබේ. මෙම වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර 2026.01.23 දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමුකර ඇත. |
| 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විෂය නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇති අතර, 2025 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යැවීමට කටයුතු සිදුකරමින් පවතියි. |
| වාහනයක් ගරහිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි. | වර්තමානය වන විට වාහනය 2 ක් අපහරණය කිරීමට ඇති අතර, එම වාහන අපහරණය කිරීමට කටයුතු සිදුවෙමින් පවතියි. |
| රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර, මේ වන විට ඒ සඳහා කටයුතු සිදුකර ගෙන යනු ලැබේ. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2023 වර්ෂයේ පැවති ණය ශේෂයෙන් රු. 580,675.66 ක ශේෂයක් මේ වන විට නිරවුල් කර ඇති බවත්, රු. 648,327.91 ක ණය ශේෂයක් නිරවුල් කිරීමට ඇති බවත් සඳහන් කරන අතර, එම ණය ශේෂය ද නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර ඇත. |
| මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | මේ වන විට මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් හැර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි. | බඳවා ගැනීම හා අනුයුක්ත කිරීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකර, විවිධ කාර්යාල වෙත අනුයුක්ත කිරීම් සිදු කරනු ලැබේ. |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | සෑම මසකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත්, මසකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් වෙත දින ඉදිරිපත් කළ ද එතුමන්ලාගේ පාර්ලිමේන්තු සහභාගිත්වය,මහජන දින,විශේෂ උත්සව හා විවිධ රැස්වීම් ආදී සියල්ල සළකා බලා මෙම කමිටුව පැවැත්වීමට දිනය ලබාදෙනු ලැබේ.<br>ඒ අනුව, මෙම කමිටු සම සභාපතිවරුන්ගේ අධික කාර්යබහුලත්වය හේතුවෙන් මාසිකව පැවැත්වීම අභියෝගාත්මක වී තිබුණ ද, හැකි |

| | |
|---|---|
| | උපරිමයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මාසිකව පැවැත්වීමට කටයුතු කරමි. |
| දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව රැස්වීම් මාසිකව පැවැත්විය යුතු බව පිළිගනිමි. නමුත් රට තුළ පවතින ඉන්ධන අර්බුදය හා අනෙකුත් හේතු මත එකම කාරණය සඳහා නැවන නැවත කැඳවීම් සිදු නොකල ද මාසිකව පවත්වන අනෙකුත් පරිසර කමිටු ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, වන ආරක්ෂණ කමිටු වැනි පොදු රැස්වීම් පවත්වන අවස්ථා වලදී හා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද, විශේෂ සාකච්ඡා මඟින් ද අවශ්‍ය දැනුවත් කිරීම් ප්‍රගති සමාලෝචනය කිරිම හා විශේෂ සාකච්ඡා පැවැත්විම බාධාවකින් තොරව සිදු කරනු ලබයි. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් නිවාස කමිටු රැස්වීම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් සංවිධානය කරනු ලබන අතර, එම රැස්වීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් කැඳවීම පමණක් සිදු කරනු ලැබේ. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි.අ | වර්තමානය වන විට දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වනු ලැබේ. |
| දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි. | රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ වන ස්වදේශ කටයුතු අංශය මඟින් 2025.09.01 දිනැති ලිපිය මඟින් යොමුකර ඇති චක්‍රලේඛ අංක 03/2025 හි 2.3 අනුව දිස්ත්‍රික් මිල කමිටුව අදාළ වර්ෂයේ මුල් මාසය තුළ රැස්විය යුතුබව සඳහන් වන අතර, සෑම මසකම කමිටුව පැවැත්විය යුතු බව සඳහන් නොවේ. වර්තමානය වන විට දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු පවත්වනු ලැබේ. |
| 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාර පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට භාවිතා කරන ලද පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ප්‍රදර්ශනය කිරිම ක්‍රියාත්මක කරනු ලබයි. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | මූල්‍ය ප්‍රකාශ වලින් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන මතයක් ලබා ගැනීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානය වන විට නියමිත දිනට කාර්යය සාධන වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. |

| | |
|---|---|
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය සභාව පිහිටුවා කාර්තු රැස්වීම් පවත්වනු ලැබේ. |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස් වී නොතිබුණි. | අභ්‍යන්තර චක්‍රලේඛ අනුව අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ සභාපති හා ලේකම් විසින් තීරණය කරනු ලබන අවස්ථා වලදී පමණක් කමිටු රැස්වීම් පවත්වනු ලැබේ. |
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | කොවිඩ් ආර්ථික අර්බුදය හමුවේ පුහුණු අවස්ථා උපරිමයෙන් පැවැත්වීමට කටයුතු කර ඇත. බොහෝ පුහුණු කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ ද පවත්වා ඇත. |
| සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 1/2025 චක්‍රලේඛ ප්‍රකාරව මේ වන විට සියලුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. |
| නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් රජයට සිදුවූ පාඩු සම්බන්ධයෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් සිදු කිරීම සඳහා විෂය භාර නිලධාරී වෙත උපදෙස් ලබාදෙන ලදී. |
| උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ස්ථාන මාරු මණ්ඩල මගින් ස්ථාන මාරු සිදුකර ඇති අතර, ආවරණය නොවන ස්ථාන මාරු ''අභ්‍යන්තර මාරු මණ්ඩල'' නිර්දේශ මත ස්ථාන මාරු කර ඇත. |

සුනිල් ගලගම,

දිස්ත්‍රික් ලේකම්/දිසාපති,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

බදුල්ල.

සුනිල් ගලගම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
බදුල්ල.

එච්.එස්.ඩී. මහේෂිකා ප්‍රනාන්දු,

ගණකාධිකාරී,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

බදුල්ල.

එච්.එස්.ඩී. මහේෂිකා ප්‍රනාන්දු
ගණකාධිකාරී
බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.